# සිදංගනා



සිසිර දිසානායක




"ලබන්නා වූ 2015 නව වසර කිරියෙන් පැණියෙන් ඉතිරෙන සුභ නව වසරක් වේවා!" යි සුභ පතමින් අලුත් අවුරුද්දේ "ගී සඳැළුවට ගොඩ වෙන්නේ අළුත් ආරංචියකුත් එක්ක.

අවුරුදු විස්සක විතර කාලයක් තිස්සේ ගීත ලියමින් ආ කෙටි ගමනක වටිනා මඟ ලකුණක් සටහන් කරන්නට අපට පහුගිය දෙසැම්බර් මාසයේ වාසනාව ලැබුණා. අවුරුදු පනහක් තිස්සේ ශ්‍රී ලංකාවේ ගීත ක්ෂේත්‍රයට ලොකු දෙයක් එකතු කරපු ආචාර්ය වික්ටර් රත්නායක සංගීතවේදියාණන් එය සමරමින් ඉදිරිපත් කරපු "වික්ටර්-අඩසියවස, දශක පහක මියැසි පහස" ප්‍රසංගයේදී "සිදංගනා" නමින් එතුමන් ගැයු ගීත ඇතුලත් සංගත තැටියක් එතුමන්ට පිළිගන්වන්නට ලැබීමයි ඒ වාසනාව. අපගේ පදවැල් වලට තනු හා සංගීතය මුහු කොට රත්නායකයන් ගැයූ ගී ඇතුලත් වුණ මේ සංගත තැටිය ඒ වේදිකාවේ, ඒ මොහොතේදීම එතුමන් හෙළ ගී කෙතේ මුදුන් මල්කඩ වන පණ්ඩිත් අමරදේවයන්ට පිළිගැන්වීමත් විශේෂ කාරණයක්. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේයි මේ උත්සවය පැවැත්වුණේ.

ඇත්තට ම මේ ගීත එකතුව එළිදැක්වීම අපගේ නිර්මාණ ජීවිතයට වැදගත් වෙන්නේ කාරණා ගණනාවක් නිසායි. කිසිම දැන හැඳුනුම්කමක් නැතිව, තැපෑලෙන් යවපු අපගේ ගී පද රචනාවක් තෝරා ගෙන ගායනා කළේ වික්ටර් රත්නායක සංගීතවේදියාණන්.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ විශිෂ්ඨ ශ්‍රේණියේ සරළ ගී වැඩසටහනක් වෙනුවෙන් ගායනා කරපු " හත් දා නව දා" ගීතයක්, ඉන්පසුව ගුවන් විදුලියේ "ගී සිත්තම්" වැඩසටහන වෙනුවෙන් ගායනා කළ "නැවුම් කන්‍යාලියක" ගීතයක් නිසා අපටගුවන් විදුලියෙන් බිහිවුණ රචකයෙක් බවට පත්වුණා. ඒ වගේ ම එක්සත් රාජධානියේ පදිංචිව ඉන්න කුසුම් සුබසිංහ වෛද්‍යවරිය එක්ක ගායනා කරපු "සොයා බලා" යුගගීය මගේ මුල් ම යුග ගී පද රචනයයි. ගීතවත් වුණ මුල් ම බුදුගුණ ගීය වන "සූර්යයාසේ", ගීයත්, මුල් ම මව් ගුණ ගීය වන "කිරිමදුවැල්" ගීයත්, රත්නායකයන් සුනිල් එදිරිසිංහ ගායන ශිල්පියාණන් එක්ක ගැයු මුල් ම යුග ගීය වන "බිතක්කනේ හැංගෙනවාෙ" ගීතයක් අපගේ ගී නිර්මාණ අතර සුවිශේෂී වෙනවා.

මුලින්  ම සංගත තැටියකට ඇතුලත් වුණ " නිය පෙළ සිඳලයි" ගීතයක් වික්ටර් රත්නායකයන්ගේ ගී එකතු වේ වෙනස් ආරක ගීයත් "කිරි මදු වැල්" ගීයේ තනුව එතුමන් යෙදුවේ මෙල්බන් නුවර උපා උපදාස මහත්තයාගේ ගෙදරදියි. ඉතින් මේ ගීත සියල්ලම "සිදංගනා" සංගත තැටියේ ඇතුලත්.

බුදුගුණ, මව්ගුණ, සොයුරු පෙම, දරු සෙනෙහස, යොවුන් ප්‍රේමය, දේශාභිමානය, යතාර්ථය, සමාජ විෂමතාව, දෙස්-විදෙස් ඓතිහාසික කරපු, සෞන්දර්ය ළමා ගීත ඔවදන් වාගේ දේවල් මාතෘකා විදියට අරගෙන පොත පතේ ඇති විදන් සිංහල භාෂාව වගේම ගැමි ජන බස් වහර, සාමාන්‍ය සරළ සිංහල බස උපයෝගී කරගෙන ලියවුන එකකට එකක් වෙනස් ගී පද රචනා එකතුවක් "සිදංගනා". වික්ටර් රත්නායකයන්ගේ තනු හා සංගීත රටාත් ඒ අනුවම එකකට එකක් වෙනස්. තාල වාද්‍ය භාණ්ඩ ගැන කතා කළොත් අපේ ගැට බෙර, දවුල්, උඩැක්කි, රබන්, උත්තර භාරතීය සංගීතයේ තබ්ලාව, දක්ෂිණ භාරතීය සංගීතයේ ඝටම්, ප්‍රස්භාෆ්, බටහිර සංගීතයේ ඩ්‍රම්ස් තාලවාද්‍ය කට්ටල ඩොලැක්කි වගේ භාණ්ඩ යොදාගෙන තියෙනවා. ඕබෝ, මවුත් ඕගන් වගේ සුසිර වාද්‍ය භාණ්ඩත්, අනිත් වයලින්, සිතාර්, ගිටර් බටනලා වගේ නිතර වාදනය වෙන භාණ්ඩ වලට අමතරව මුහු වෙලා. බැතිබරබව, සෙනෙහස ආලය, අභිමානය, සුන්දරත්වය ළමා බවේ සුරතලය වගේම විනෝදකාමී බව දනවමින් වික්ටර් රත්නායකයන් නිර්මාණය තනු වලට එතුමන්ගේ මියුරු, ගායනීය හඬ එක් වෙලා තියෙන්නේ ඒවා" ගී පද අරුත්වලට උපරිම සාධාරණත්වය කරමින්.

පහුගිය පනස් වසරක කාලයේ වික්ටර් රත්නායකයන් ඇසුරේ බිහිවුණේ සංගීතවේදීන්, ගායන ශිල්පීන් විතරක් ම නෙවෙයි. ගී පද රචකයින්, නිවේකයින් පවා ඒ පසුබිමේ තමන්ගේ හැකියාවන් පෙන්වමින් ඉදිරියට ආවා. විදෙස් ගතව ඉන්න, ගායන හැකියාවන් තියෙන අපේ අයටත් රත්නායකයන්ගෙන් ලැබුණ ආලෝකය




අමතක කරන්න අමාරුයි. එක්සත් රාජධානියේ පදිංචි වෛද්‍ය කුසුම් සුබසිංහ වගේම මෙල්බන් නුවර ශිරෝමා ප්‍රනාන්දු, සරිනි දිසානායක සිඩ්නි නුවර තිසල් වංසජ පාදුක්ක විතාන වගේ අපේ එක්ක කළ යුග ගායනා "සිදංගනා" එකතුවට එක් කරගන්නේ රත්නායකයන්ගේ ඒ දායකත්වය සිහිපත් කරවමින්. ඒ වාගේම මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් බිහිවුණ විශාරද මනීෂ විජේකෝන් යෞවනයා එක්ක ගායනා කළ යුග ගීතයකුත් කොළඹ විශාඛා විද්‍යාලයේ ගයාත්‍රී ඒකනායක සංගීතාචාර්යවරිය එක්ක ගැයු යුග ගීතයකුත් මේ එකතුවට ඇතුලත්. රත්නායකයන්ගේ සංගීතය හා තනුවට අනුව " සඳකඩ පහනක" ගීය ගයමින් ගායනා ලෝකයට පිවිසි සුනිල් එදිරිසිංහයන් ගැයු යුග ගීයද මේ සංගත තැටියට ඇතුලත් කළේ එදිරිසිංහයන්ගේ උනන්දුවත් එක්කයි.

ගුවන් විදුලියේ ප්‍රචාරය වෙන ගීත ඒ දවස්වල විදෙස්ගත අපට අහන්න ලැබුණේ නෑ. ඒ නිසා ඒ ගීත ආයෙමත් පටිගත කරගෙන නිවසේදී, වාහනයේ දී අහන්න පුළුවන්නම් හොඳයි කියලා මේ රටට ආව දවස්වල හිතුණා. ඒ අදහසට වික්ටර් රත්නායකයන් එකඟ වුණා. ඉතින් අවුරුද්දකට ගීතයක් දෙකක් අතේ මුදල් ඉතුරු වෙලා තිබුණ විදියට කළා. මේ අතරට කුසුම්, ශිරෝමා, තිසල්, මනීෂ එයාලගේ සංගත තැටි වලට කරපු ගීතත් එකතු වුණා. අන්තිමේ මේ එකතු වෙලා තියෙන්නේ එකකට එකක් වෙනස් ගීත එකතුවක් නේද කියලා හිතුණා.ඒවා එක් කරලා සුභාවිත ගීතයේ සෞම්‍යාශ්වාදය විඳින්න කැමති අය අතරට සංගත තැටියක් විදියට ඉදිරිපත් කරන්න හිතුණේ ඒ නිසායි.

තමන්ගේ තනු හා සංගීත නිර්මාණ වලට, ගායනයට කිසිම මුදලක් අය නොකර හිතවත් කමට විටින් විට ගීත පටිගත කරලා දුන්න වික්ටර් රත්නායකයන්ට අපේ ස්තූතිය මුලින්ම පිරිනමන්න ඕන. ඒ වෙනුවෙන් කෘතගුණ සළකමින් සංගත තැටිය එතුමන්ට පිළිගැන්නුවේ සියලු අළෙවි ආදායම් එතුමන්ටම ලැබෙන්නට සළස්වමින්. අප වෙනුවෙන් දිල්හාන් පද්මරත්න, සුමිත් පෙරේරා සොයුරන් නිර්මාණය කළ "සිසාරා ඩොට් කොම්" :උදඋගිසීර්ගප්දප* වෙබ් අඩවියේ එක අරමුණක් වන්නේ සමාජ ෂත්කාරය. ඒ අනුව "සිසාරා ඩොට් කොම්" නමින් කළ මුල් ම සද්කාර්යය වන්නේ වික්ටර් රත්නායකයන් වෙනුවෙන් කළ "සිදංගනා" සංගත තැටියයි.

නිෂ්පාදනයේ දී මුල්‍යමය අනුග්‍රහය දැක් වූ මහනුවර පදිංචි ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (පේරාදෙණිය) සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වර්තමාන සභාපති ආචාර්ය එස්.බී. විජේකෝන් මහත්මාටත්, මෙල්බන් නුවර ශාඛා අධ්‍යාපන ආයතනයේ අධිපති ආචාර්ය කුලාන් රණසිංහ මහත්මාටත්, මොරවක දිශාන්වැලි තේ කර්මාන්ත ශාලාවේ අධිපති ලෙනාඩ් ජයසිංහ මහත්මාටත් අපගේ ස්තුතිය හිමි වෙනවා. ඒ වගේම නන් අයුරින් උපකාර කළ ආනන්ද විද්‍යාලයේ අපගේ පන්ති මිත්‍රයින් දෙපළක් වෙන මෙල්බන් හි මහේන්ද්‍ර කාලිංගමුදලි හා සිඩ්නි නුවර සරත් ගාමිණී පෙරේරා සොයුරන්වත් මතක් කරන්න ඕන. ඉතාම සෞම්‍ය පිටකවරයක් නිර්මාණය කරපු සිසිර විජේතුංග, මුලික " මාස්ටර්" සංගත තැටි පිටපත සකස් කළ අනුර රණසිංහ යන මහත්වරුන්ව ද සිහිපත් කරන්න ඕන. යුග ගායනා වලින් සහය වුණ හැමෝටමත් ස්තූති කරන්න ඕන.

විසි වසරක් පුරා මේ ආ ගමනේ දී වික්ටර් රත්නායකයන්ට අමතරව මගේ පද රචනා සංගීතවත් කළ ආචාර්ය රෝහණ වීරසිංහයන්, ලයනල් රන්වලයන් ඇතුලු සියලුම සංගීතවේදීන්වත්, පද රචනා ගීතවත් කළ විශාරද නන්දා මාලනී, විශාරද දීපිකා ප්‍රියදර්ශනී, විශාරද අමරසිරි/පිරිස්,නිරෝෂා විරාජිනී, ජානක වික්‍රමසිංහ, කීර්ති පැස්කුවෙල්, සහන් රන්වල ප්‍රමුඛ රන්වල බලකාය,   විශාරද වසන්තා මධුරංගනී ඇතුළු සියළු ගායන ශිල්පීන්වත් සියළු වාද්‍ය ශිල්පීන්වත්, තාක්ෂණික ශිල්පීන්වත් ආදරයෙන් මතක් කළ යුතු වෙනවා. අවසන් වශයෙන් අප ලියු ගී ඇසු රසිකයි න් හා ඒවා විමසු විචාරකයින්ට අපේ කෘතවේදී බව පළකරනවා.

